ජනසමාජයක චින්තනය වඩාත් ශිෂ්ට සම්පන්න ලෙසින් හැඩගැස්වීම සඳහා ශිෂ්ට සම්පන්න භාෂාවකට සිදුකළ හැකි බලපෑම සම්බන්ධව සමාජ වගකීමක් මාධ්‍ය අතද තිබේ. කෙසේ වෙතත් මෙම වගකීම නොසලකා හරිමින් මාධ්‍ය මගින් භාවිතා කරනා ඇතැම් යෙදුම් ඔස්සේ සමාජ චින්තනය වෙත අහිතකර බලපෑමක් ඇතිකරන්නා සේම, ඒ ඔස්සේ සමාජයේ යම් යම් කොටස් කොන් කිරීමකට ලක් වීමද සිදුවිය හැක.

මීට උදාහරණ ලෙසින් අරුණ, ලංකාදීප, මව්බිම, දිවයින (01/06) පුවත්පත් තුළ වූ විවිධ පුවත් වාර්තාවන්හි සඳහන් වන "කුඩු ලෝලීන්", "මත්ලෝලියා", "කුඩ්ඩෙක්" වැනි යෙදුම් දැක්විය හැක.

කුඩ්ඩා වැනි යෙදුමක් සමග බැඳි සමාජ ගර්හාවක් හා කොන් කිරීමක් පවත්නා නිසා, දිගින් දිගටම එවැනි යෙදුම් භාවිතය ඔස්සේ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් හට පුනරුත්ථාපනයෙන් පසුව හෝ සමාජයට එක් වීමට ඇති අවස්ථාව යම් ප්‍රමාණයකට අවහිර නොවන්නේදැයි විමසිය යුතු වේ. එසේම මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීමක් පසුපස සංකීර්ණ කරුණු ගණනාවක් පවත්නා හෙයින්, එය හුදු මත්ද්‍රව්‍ය සඳහා වන ලෝලත්වයක් බවට ලඝු කළ හැකිද යන්න ප්‍රශ්නකාරී වේ. එබැවින්, "කුඩු ලෝලීන්", "මත්ලෝලියා" වැනි යෙදුම් භාවිතයද ගැටළුකාරී වේ.

මේ නිසා ශිෂ්ට සම්පන්න සමාජ චින්තනයක් උදෙසා මාධ්‍ය වගකීම වන්නේ, "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්", "මතට ඇබ්බැහි වූවන්" යනාදී වඩාත් යෝග්‍ය යෙදුම් යොදාගැනීම නොවන්නේදැයි අපි අසමු. මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Divaina #Aruna #Mawbima